# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2116/28 - 2019 මාර්තු මස 26 වැනි අඟහරුවාදා - 2019.03.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 19/78 (iv)

### 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 61 වන වගන්තිය යටතේ අග්‍රවිනිශ්චයකාරවරයා විමසා අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝගය.

තලතා අතුකෝරල,
අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 මාර්තු මස 20 වන දින,
කොළඹ දී ය.

නියෝගය

කලින් කල සංශෝධිත 1979 ජූලි 2 වන දින අංක 43/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වන වගන්තිය සමග කියවිය යුතු 61 වන වගන්තිය යටතේ සාදන ලද නියෝගයේ, I වන තීරයේ සඳහන් ''කොළඹ අධිකරණ කලාපයෙහි පවත්වනු ලබන ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය'' යන සඳහනට අනුකූල වන්නා වූ උපලේඛනයේ II වන තීරයේ සඳහන් 4 වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන් එම නියෝගය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

''4. ශ්‍රී ලංකාවේ යම් අධිකරණ කලාපයක දී සිදු කරන ලද, දණ්ඩ නීති සංග්‍රහයේ 120 වන වගන්තිය යටතේ වූ වැරදි සම්බන්ධයෙන් වූ සියලු නඩු පැවරීම්, නඩු කටයුතු හෝ කාරණා ;

5. අල්ලස් පනතේ V වන කොටස යටතේ වූ සියලු වරදවල්.'' ; සහ''.

04 - 299

1A - PG 4447 — 517 (2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*